# සුනාමිය

"ඉනමුරා නෝ හී" ජපන් කථාව ඇසුරින් සැකසුණු
හීන්බණ්ඩාගේ කථාවෙන් පාඩමක් ඉගෙනගනිමු!



# 2004 දෙසැම්බර් 26 වැනිදා ඉන්දියානු සාගරයේ සිදුවූ සුනාමි ඛේදවාචකය

වසර 2004 දෙසැම්බර් 26 වැනිදා ඉන්දියානු සාගරයේ සිදුවූ සුනාමි විපත ඉන්දුනීසියාව, තායිලන්තය, ශ්‍රී ලංකාව හා ඉන්දියාව වැනි රටවලට ඉතා තදබල ලෙස බලපෑ අතර ලක්‍ෂ 2 කට වඩා මිනිස් ජීවිත හානියක් හා මහා බිහිසුණු දේපළ විනාශයක් කිරීමට සමත් විය.









සුනාමි විපතකින් අපගේ ජීවිත බේරාගන්නේ කෙසේද?

↓

අපේ ගමේ නායකයා වූ හීන්බණ්ඩාගේ ප්‍රඥාගෝචර හා එඩිතර ක්‍රියාව නිසා අපේ ගමේ මිනිසුන්ගේ ජීවිත විශාල සංඛ්‍යාවක් බේරාගැනීමට හැකිවුණා.

# "හීන්බණ්ඩා"

ගමේ නායකයා වුනාට අනෙක් අය වගේම හීන්බණ්ඩත් ගොවියෙක්. ගමේ උසම තැන තමයි එයාගෙ කුඹුර පිහිටලා තිබුණෙ. කඳු මුදුනට මුළු ගම්මානයමත්, ඈත මුහුදත් බොහොම හොඳට පේනවා. වෙනද වගේම ඒ හැන්දෑවෙත් හීන්බණ්ඩා එයාගෙ පැලේ මිදුලෙ තිබුණ බංකුවෙ වාඩිවෙලා විවේක ගනිමිනුයි හිටියෙ. අස්වැන්න නෙලාගත්තෙ අදයි. හෙට තමයි අස්වැන්න පාගන්න ගමේ තරුණයො එන්නෙ.

කඳු මුදුනෙ හිටපු නිසා පහළ තියෙන මැගි අක්කගෙ ගෙදර එයාට හොඳට පේනවා. අද මැගි අක්කගේ ගෙදර පිරිත නිසා ගමේ හැමෝම කන්ද පහලට ඇවිල්ලා. හාමුදුරුවොත් පන්සලේ ඉඳල වඩිනව හීන්බණ්ඩා දැක්කා. එකයි, දෙකයි, තුනයි, හතරයි, පහයි, හයයි ... කහපාට සිවුරු ඇඳගෙන හාමුදුරුවරු වඩින දිහා හීන්බණ්ඩා බලාගෙන හිටියා.



එකපාරටම පොළව හෙලවෙන්න පටන්ගත්තා.
අපිට හිතෙයි හීන්බණ්ඩගෙ කුඹුරෙ අලියෙක් බර අඩි තියල ඇවිදිනවා කියලා.



"භූමි කම්පාවක්" හීන්බණ්ඩාට හිතුනා. "ඒත් මට මීට කලින් මේ වගේ ලොකු භූමි කම්පාවක් දැනිල නැහැනෙ."
ඒකෙ සද්දෙ හරියට අහස ගොරවනව වාගේ.
හෙමින් හෙමින් ගොඩක් වෙලා ඇහුණා.

හීන්බණ්ඩ පහල බැලුවා.
අද මුළු ගමම හිටියෙ මැගි අක්කගේ ගෙදර.
ඒ ගොල්ලො හැමෝම ලෑස්තිවෙලා හිටියෙ
පිරිත් අහන්න.

භූමිකම්පාව නම් ඒ කාටවත් දැනුන බව
පෙනුනෙ නැහැ.



හීන්බණ්ඩ මුහුද දිහා බැලුවා. අමුතු දෙයක් සිද්ද වෙමින් තිබුණා. මුහුද වෙරළින් ගොඩක් ඈතට ගිහිල්ලා. වෙනදට එයා දකින වෙරළෙ හැපෙන රැළි එකක්වත් දකින්න තිබුණෙ නැහැ. හීන්බණ්ඩාට පේන්න තිබුණෙ වැලිත්, ගල්පරත්, මාළුත් විතරයි.

"දෙවියනේ" සුනාමියක් එනවා. මම ඒ ගොල්ලන්ට දැන්නුවෙ නැත්නම් මුළු ගමම ඉවරයි. ඔහු හිතුවා.

හීන්බණ්ඩ අත්දෙක එකතුකරල තමන්ට පුළුවන් තරම් හයියෙන් "හූ" කිව්වා. හූ.... හූ.... හූ...... එත් හාමුදුරුවන්ගෙ පිරිත් හඬ නිසා "හූ" හඬ කාටවත් ඇහුනෙ නැහැ.



හීන්බණ්ඩට කරන්න කිසිම දෙයක් හිතාගන්න බැරිවුණා. එයා කුස්සියට දිව්වා. ලිපෙන් ගිනි පෙනෙල්ලක් අරගෙන අස්වනු මිටි ළඟට දිව්වා. ඒ තමයි එයාගෙ වටිනාම සම්පත. මේ අස්වැන්න ගන්න හීන්බණ්ඩා දවල් රෑ දුක්වින්දා, ගොඩක් මහන්සි වුණා.

"මම මේ කුඹුර අස්වද්දන්න ගොඩක් මහන්සිවුණා තමයි. ඒත් මට මේකෙන් ගමේ මිනිස්සුන්ගෙ ජීවිත බේරගන්න පුළුවන්වෙයි" ඔහු හිතුවා.

හීන්බණ්ඩා අස්වැන්නට ගිනි තිබ්බා.



මුළු අස්වැන්නම ඉක්මනින් ඇවිළෙන්න පටන්ගත්තා. ඉරත් බැහැගෙන යමින් අඳුර වැටෙමිනුයි තිබුණේ. මිනිස්සු ඔක්කොටම ගින්න හොඳට පෙණුනා.

"අයියෝ..." තරුණයෙක් කෑගැහුවා. "හීන්බණ්ඩගෙ පැල ගිනිගන්නවා, අපි එයාව බේරගන්න ඕනේ."

තරුණ කට්ටිය ඔක්කොම කෑගහගෙන කඳු මුදුනට දුවන්න පටන් ගත්තා. වුනේ මොනවද බලන්න ගමේ අනෙක් කට්ටියත් පස්සෙන් දිව්වා.



මුලින්ම ආපු තරුණයෝ ගෝනිවලින් ගහල
ගින්න නිවන්න උත්සාහ කළා.
කට්ටියක් පැල පිටිපස්සෙ තිබුණ ළිඳට වතුර ගේන්න දිව්වා.
හීන්බණ්ඩා ඒ ගොල්ලන්ව නැවැත්තුවා.

"නෑ... නෑ... ගින්න ඔහේ තියෙද්දෙන්, සුනාමියක් එනවා.
දුවල ගිහින් හැමෝටම කියන්න
කඳු මුදුනට දුවන්න,"
කියලා හීන්බණ්ඩා කිව්වා.



ඉක්මනින් ගම්වැසියෝ ඔක්කොම කඳු මුදුනට රැස්වුණා.
ඒ ගොල්ලො ගොඩක් බය වෙලයි හිටියෙ.
ඒත් ඒගොල්ලෙ මුහුදට වෙලා තිබුණ දේ දැක්කෙ නැහැ.
කඳු මුදුනට ඇවිත් තිබුණෙ හීන්බණ්ඩගෙ අස්වැන්න බේරගන්නයි.

හීන්බණ්ඩා ඒගොල්ලන්ට මුහුද පෙන්නුවා.
"බලන්න ! සුනාමියක් එනවා."



හඳ එළියෙන් ගම්වැසියෝ දැක්කා වෙරළ තීරුව අඳුරු ඡායාවකින් වැහිල යනවා. එකපාරටම මහා විශාල රැල්ලක් ආපහු වෙරළ දෙසට එමින් තිබුණා. ඒ රැල්ල වෙරළෙ තිබුණ පොල්ගස්වලටත් වඩා උසයි.

රැල්ල ඇවිත් වෙරළෙ තිබුණ ගස් පෙරළලා දැම්මා.
ඒ එක්කම ගෙවලුත් පංසලත් වහගත්ත.
මැගි අක්කගෙ ගෙදරත් ඒ රැල්ලෙන් යටවුනා.
රැල්ල තව තවත් ළඟටම ආවත් කඳු මුදුනෙ හිටපු හැම දෙනෙක්ම බේරුනා. ඒ ගොල්ලො තමන්ගෙ ගම විනාශ වෙනව ගොඩක් වේදනාවෙන් බලාගෙන හිටියෙ.
රැල්ල ආපහු මුහුදට ගියත් ආයෙ ආයෙත් ආවා.



දැන් මිනිස්සුන්ට තේරෙනව හීන්බණ්ඩ අස්වැන්නට ගිනි තිබ්බෙ ඒගොල්ලලන්ට මේ විනාශය දන්වන්න කියලා. එයා තමන්ගෙ වටිනා අස්වැන්න විනාශ කරලා තිබුණෙ ඊට වඩා වටින ජීවිත ගනනාවක් බේරගන්න.


ගම්වැසියන්ට හීන්බණ්ඩට ස්තුති කරන්න තරම් වචන හොයාගන්න බැරිවුණා.
එක්කෙනා, එක්කෙනා ඇවිත් තමන්ගෙ ජීවිතේ බේරගත්ත එක වෙනුවෙන් හීන්බණ්ඩට වැඳවැටුනා.



# සුනාමියක් යනු කුමක්ද?





පොළොවේ මතුපිට ස්ථරය සෑදී ඇත්තේ ඉතා ඝනකම තල කිහිපයකින් සමන්විත ස්ථරයන්ගෙනි. එම ඝනකම තලවලට පහලින් පිහිටි පාෂාණ ඉතා අධික උෂ්ණත්වයකින් යුතු අතර ඒවා බොහෝ සෙයින් දියර මෙන් පවතී. මෙම දියර කොටස් එහා මෙහා චලනය වීමෙන් පොළොව මතුපිට සෑදී ඇති ස්ථරයන් වෙත එල්ලවන තදබල පීඩනය හේතුකොට ගෙන මේවා අස්ථායී තත්වයට පත්වී එහා මෙහා චලනය වීමක් සිදුවේ.




එක් ස්ථරයක් අනෙක් ස්ථරය හා ගැටීමක් සිදුවූ විට එම ස්ථරය මඟින් අනෙක් ස්ථරය වෙත දැඩි පීඩනයක් එල්ලවේ. මෙම පීඩනය ක්‍රමක්‍රමයෙන් දීර්ඝ කාලයක් තිස්සේ වර්ධනය වේ.

එසේ එල්ලවන පීඩනය ඉතා අධික වූ විට තල දෙකේ ස්ථායීතාවය බිඳී එකක් අනෙක අභිබවා ලිස්සායාමක් සිදුවේ. එය භූමිකම්පාවක් ලෙස හැඳින්වේ. මෙම තලවල පිහිටීමේ වෙනස සුනාමි තත්ත්වයකට හේතුවේ.





සුනාමියක් භූමිකම්පාවක් සිදුවූ විගස වුවද සිදුවිය හැකිය !!!

සමහර අවස්ථාවලදී මුහුදුවතුර ආපසු යාමක් හෝ වෙරළ ආසන්නයේ මුහුද සිඳීයාමක් හෝ සිදුනොවේ.




යම් අවස්ථාවක ඔබට භූමිකම්පාවක් සිදුවූ බව හැඟී ගියහොත් වහාම කඳු මුදුනකට හෝ උස ස්ථානයකට ළඟාවන්න.





ප්‍රවේශම්වන්න...!!!

ඉතා ඈත මුහුදේ භූමිකම්පාවක් සිදුවුවහොත් එය ඔබට නොදැනේවි, නමුත් සුනාමියක් සිදුවීමට අවකාශය ඇත...!!!



ඉතා වේගයෙන් ගමන් ගන්නා අහස්යානයක් මෙන් සුනාමියක් ඉතා වේගවත්ව වෙරළවෙත ළඟාවිය හැක...!!!





සාමාන්‍යයෙන් සුනාමියකදී රළ පහර එකකට වඩා වැඩි විය හැක...!!! පැය කිහිපයක් පමණ ආරක්‍ෂිත ස්ථානයක රැඳීසිටින්න...!!! පළමු රළ පහර විශාල හා හානිදායක නොවේ...!!! දෙවන හා තුන්වන රළ පහර වඩා විශාල හා හානිකර වේ...!!!

**Published by**

Asian Disaster Reduction and
Response Network (ADRRN)

Asian Disaster Reduction Center (ADRC)

**With the support of**

The Government of Japan

**Distributed by**
Sarvodaya Shramadana Movement - Sri Lanka

Printed by Wisemen Lanka Consultants - Sri Lanka